ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
சமுத்திர பல்கலைக்கழகம்
The Ocean University of Sri Lanka

2021

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය
திறன்கள்அபிவிருத்தி, தொழில்முறைஆய்வு, ஆராய்ச்சிமற்றும்புத்தாக்கஇராஜாங்கஅமைச்சு
State Ministry of Skills Development, Vocational Education, Research and Innovation

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

වාර්ෂික වාර්තාව හා ගිණුම්

2021

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

කාක දුපත, මට්ටක්කුලිය, කොළඹ 15.

දුරකථන - 011-4346973 ෆැක්ස් - 011-2525103

විද්‍යුත් තැපෑල : oceanuniversity@ocu.lk

අන්තර්ජාලය : www.ocu.lk

දැක්ම

සමුද්‍ර, සමුද්‍රීය හා ධීවර අංශ සඳහා නව්‍ය විසඳුම් ලබාදීම.

මෙහෙවර

කලාපයේ සමුද්‍ර හා ධීවර අධ්‍යාපනයේ විශිෂ්ඨත්වයේ කේන්ද්‍රස්ථානය වීම.

විශ්වවිද්‍යාලයේ අරමුණු

2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 11 වන කොටසේ විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීමේ අරමුණු පහත අයුරින් දක්වා ඇත.

01. ධීවර ,සමුද්‍ර විද්‍යා, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා දීම සඳහා විධිවිධාන සැලැස්වීම.

02. යම් ප්‍රදේශයක මිනිස්බල අවශ්‍යතා සපුරාලීම අරභයා ධීවර හා සමාන ක්ෂේත්‍රවලට අදාළ වෘත්තීය සහ තාක්ෂණික අධ්‍යාපන පාඨමාලා සඳහා අවස්ථා ලබා දීම.

03. ධීවර හා සමාන ක්ෂේත්‍රවල නියැලී සිටින තැනැත්තන් අතර ධීවර, සමුද්‍ර සහ සමුද්‍රීය අංශවලට අදාළ දැනුම ව්‍යාප්ත කිරීම.

04. ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය උදෙසා ව්‍යාප්ත පාඨමාලා සඳහා විධිවිධාන සැලසීම.

05. විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා ධීවර හා සමාන ක්ෂේත්‍රවල සේවක මඩුලු සඳහා වෘත්තීය සහ තාක්ෂණික පාඨමාලා සැපයීම.

06. ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා ගැනීමට ශිෂ්‍යයන්ට ඇති දක්ෂතාවය සහ හැකියාව මත පදනම්ව ඉංජිනේරු ශිල්පය, විද්‍යාත්මක, තාක්ෂණික සහ වෘත්තීමය අධ්‍යාපනය සහ පුහුණුවීමේ පද්ධති යන ක්ෂේත්‍රවල ප්‍රගති සංවර්ධනය සඳහා විධිවිධාන සැළැස්වීම.

07. ජාතික වෘත්තීයමය සුදුසුකම් ඇති තැනැත්තන් සඳහා අධ්‍යාපන පාඨමාලා සඳහා විධිවිධාන සැලසීම සහ ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල ඔවුන්ගේ ප්‍රවීණත්වය වැඩි දියුණු කිරීම සඳහා සහ ශාස්ත්‍රීය සුදුසුකම් අත්කර ගැනීම සඳහා ඔවුන්ට සහාය වීම.

උපකුලපති පණිවුඩය



සාගරය මූලික කරගත් නීල හරිත ආර්ථිකයක් ගොඩනැඟීමේ නියමු කාර්යභාරයේ නියැළෙන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය නිපුණත්වයෙන් යුතු ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමේ තවත් වසරක් ලෙස 2021 වසර සටහන් තබමින් විශ්වවිද්‍යාලයේ සිව්වන උපකුලපති කාර්යභාරය මා විසින් භාර ගැනිනි.

සාගරය කේන්ද්‍රීයව භූගෝලීය වශයෙන් නාවික සන්ධිස්ථානයක පිහිටි ශ්‍රී ලංකාව ආර්ථික ස්ථායිකරණ කාර්යයෙහි ආයතනික කාර්යභාරය හඳුනා ගෙන ඇති අප විශ්වවිද්‍යාලය, සාගර සම්පත් ඵලදායි ලෙස භාවිතා කිරීම සඳහා අවැසි පුහුණු හා කුසලතාවයෙන් හෙබි මානව සම්පත් සමාජයට දායක කිරීමේ නියැළී ඒ සඳහා සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරයි. ඒ අනුව, ඉහත කී අරමුණ සාක්ෂාත් කරගැනිම පෙරදැරිව විශ්වවිද්‍යාලයේ ක්‍රියාත්මක උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු යන අංශ, 2021 වසර තුළ දී වඩාත් ඵලදායි ඉදිරි දැක්මක් සහිතව සැළසුම් කිරීම සහ සංවිධානය කිරීමේ කාර්යභාරයට නායකත්වය ලබා දීම සිදු කර ඇත.

අධ්‍යයන හා පුහුණු කාර්යයෙහි විශේෂිත සංධිස්ථානයක් සනිටුහන් කරමින් උපාධි සහ ජාතික නිපුණතා මට්ටම් (NVQ) අතර සබඳතා ගොඩනැඟීම සඳහා විශ්වවිද්‍යාලයීය අධ්‍යයන ධාරාව තුළ කුසලතා පුර්ණ ශ්‍රම බලකායක් බිහිකිරීමේ මූලික පියවරක් ලෙස 2021 වසර තුළ දී තාක්ෂණවේදී උපාධි පාඨමාලා හඳුන්වා දී පාඨමාලා සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීම සිදු කරන ලදී.

එමෙන්ම 2021 වසර තුළදී උසස් අධ්‍යයන අංශයේ ක්‍රියාත්මක උපාධි පාඨමාලාවන්ට අමතරව පර්යේෂණ පාදක කරගත් දර්ශන විශාරද සහ දර්ශනපති ආදී පශ්චාත් උපාධි හා විද්‍යාපති උපාධි ප්‍රදානයන්ටද සාගර විශ්වවිද්‍යාලයේ දායකත්වය ලබාදීම හරහා උසස් අධ්‍යයන අංශයේ කටයුතු පුළුල් කිරීමට හැකිවිය. තවද, නව උපාධි පාඨමාලා සඳහා විෂය නිර්දේශ සැකසීම ද 2021 වසර තුළදී සිදු කෙරිණි.

සාගර විශ්වවිද්‍යාල පනතේ VII කොටසේ උපාධි ප්‍රදානෝත්ස්වය පැවැත්වීම පිළිබඳ මාර්ගෝපදේශ ප්‍රකාරව (2) උපවගන්තිය යටතේ උපාධි ප්‍රදානෝත්සවයක් නොපවත්වා උපාධි ප්‍රදානය කිරීමට හැකිවීම කොවිඩ් (Covid -19) වසංගතය හමුවේ 2021 වසර තුළ ලැබූ විශේෂිත වූ ජයග්‍රහණයක් ලෙස ඉතිහාසයට එක් වේ. ශ්‍රී ලංකාව තුළ පැවති කොවිඩ් (Covid -19) වසංගත තත්ත්වය මත මෙම විශේෂිත වූ උපාධි ප්‍රදානෝත්ස්වය මඟින් උපාධිලාභී ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා විවිධ රැකියා අවස්ථා සහ පශ්චාත් උසස් අධ්‍යාපනික අවස්ථා ලබා ගැනීමට මං පෙත් විවර විය.

විශ්වවිද්‍යාලයේ පරිපාලන ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා සේවක ගැටළු විසඳීම, විශ්වවිද්‍යාලයීය ව්‍යුහ ශක්තිමත් කිරීම, නව උපාධි පාඨමාලා හා වෘත්තීය පුහුණු පාඨමාලා හඳුන්වා දීම සහ පාඨමාලා නවීකරණයන් හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම යන ප්‍රමුඛ ක්ෂේත්‍රයන් සඳහා වසර තුළදී වැඩි අවධානයක් යොමු කිරීමට ලැබීම විශ්වවිද්‍යාලයීය කාර්යභාරයන් ඉටුල් කිරීමට හේතු විය.

2021 වසර තුළ දී ස්ථාපනය කරන ලද විශ්වවිද්‍යාලයීය මූල්‍ය කමිටුව (Finance Committee) රාජ්‍ය මුදල් විනිවිදභාවයකින් හා ඵලදායී ලෙස යෙදවීම, පරිහරණය කිරීම අරමුණු කර ගනිමින් කටයුතු සම්පාදනය සිදු කෙරේ. මූල්‍ය කමිටුව, රේඛීය අමාත්‍යාංශය හා රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුවේ නියෝජනයන් සහිතව මූල්‍ය දැනුමනි පාලන මණ්ඩල සාමාජිකයින් සහ විශ්වවිද්‍යාලයීය නියෝජනයකින්ද සමන්විත වේ.

මීට අමතරව, පීඨාධිපති කමිටු, පුස්තකාල කමිටු හා නෞකා නඩත්තු ආදී කමිටු පිහිටුවා අධ්‍යයන හා පරිපාලන කටයුතු යථාවත් කිරීමට ද කටයුතු කරන ලදී.

මහජන යහපත උදෙසා මූල්‍ය පරිහරණය ඵලදායී ලෙස සිදු කෙරෙන බවත් එය විනිවිදභාවයෙන් සිදු වී ඇති බවටත් තහවුරු කිරීම, විගණන අංශය මඟින් සිදුකිරීම තුළින් ඵලදායී හා කාර්යක්ෂම රාජ්‍ය සේවාවක අප විශ්වවිද්‍යාලය නිරත වී ඇති බව පෙන්වා දිය හැක.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සඳහා ස්ථීර ගොඩනැඟිලි පරිශ්‍රයක් ඉදිකිරීම උදෙසා කොයිකා (KOICA) ව්‍යාපෘති ආධාර ලබා ගැනීමට අදාළ ව්‍යාපෘති වාර්තාව සඳහා පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව (EIA Report) සැකසීමේ කටයුතු ද 2021 වසරේදී මුලිකව සිදු කිරීමට හැකිවීම විශ්වවිද්‍යාලයේ ඉදිරි ගමන් මඟේ කඩඉමක් ලෙස සැලකිය හැකි වේ.

2021 වසර තුළදී සාගර විශ්වවිද්‍යාලයීය පාඨමාලා හරහා නිරසාර සංවර්ධනයන්ට දායකත්වය ලබා දෙමින් සාගර කේන්ද්‍රීය **සමුද්‍ර, සමුද්‍රීය හා ධීවර අංශ** සඳහා අගය එකතු කිරීමක් සිදු කර ඇත. 2022 වසර තුළ දී විශ්වවිද්‍යාලය සපයනු ලබන පුහුණුව තුළින් සම්පත් භායනය, නිරසර නොවන ධීවර පුරුදු වැනි විවිධ සාගර ගැටළු විසඳීම සඳහා අවැසි කුසලතා සපිරි මානව සම්පතක් බිහිකිරීම මෙන්ම පරිසර දූෂණය අවම කර නිරසාර සාගර පරිසර පද්ධතියක් සුරක්ෂිත කිරීම සඳහා ද සාගර විශ්වවිද්‍යාලයීය සියලු කාර්යය මණ්ඩල සහයෝගය මත ක්‍රියාකිරීමට අපේක්ෂා කරමි.

Prof.Wasantha Rathnayake,PhD
Vice Chancellor
Ocean University of Sri Lanka
Crow Island, Colombo 15.

මහාචාර්ය වසන්ත රත්නායක, Ph.D
උපකුලපති,
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය.

පටුන

01. පාලන මණ්ඩලය සහ සංයුතිය

02. ශාස්ත්‍රීය සභාව සහ සංයුතිය

03. දළ විශ්ලේෂණය

03.1 ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලයේ ආරම්භය ,විකාශය සහ අරමුණු

03.2 ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ, කාර්යභාරය සහ සේවා දායකත්වය

04. උසස් අධ්‍යයන අංශය

05. පුහුණු අංශය

06. පාලන අංශය

07. අභ්‍යන්තර විගණන අංශය

08. ශේෂ පත්‍රය සහ ආදායම් වියදම් ගිණුම්

09. විගණකාධිපති වාර්තාව

10. විගණකාධිපති වාර්තාවට කරන ලද පැහැදිලි කිරීම්

01. පාලන මණ්ඩලය හා සංයුතිය

01.	මහාචාර්ය ආර්.එම්. වසන්ත රත්නායක මහතා	උපකුලපති, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය (සභාපති)
02.	ආචාර්ය එම්.එෆ්.එම්. ෆයිරෝස් මහතා	පීඨාධිපති, ධීවර හා සමුද්‍රය විද්‍යා පීඨය (පාලන මණ්ඩල සාමාජික)
03.	ආචාර්ය එච්.බී. ජයසිරි මහතා	පීඨාධිපති, ඉංජිනේරු හා කළමනාකරණ පීඨය (පාලන මණ්ඩල සාමාජික)
04.	දීපිකා කේ. ගුණරත්න මහත්මිය	අතිරේක ලේකම්, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය
05.	එස්.සී. සේනාරත්න මහතා	අධ්‍යක්ෂ, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
06.	වී. වසන්තා කුමාරි මහත්මිය	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
07.	ඉංජිනේරු ඩී.වී. අබේසිංහ මහතා	පාලන මණ්ඩල සාමාජික කොළඹ නැව් තාටාකාංගනය
08.	මහාචාර්ය රංජිත් සේනාරත්න මහතා	සභාපති, ජාතික විද්‍යා පදනම (පාලන මණ්ඩල සාමාජික)
09.	ආර්.ඒ.ඩී.එස්. රණතුංග මහතා	අධ්‍යක්ෂ ජනරාල්(තාක්ෂණික), ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය
10.	ඩබ්.බී.එම්.ඊ්.ඩී. බස්නායක මහතා	සභාපති, වෘත්තීය පුහුණු අධිකාරිය
11.	මහාචාර්ය නවරත්න රාජා	සභාපති, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (පාලන මණ්ඩල සාමාජික)
12.	තරංග නලීන් ගම්ලත් මහතා	සභාපති, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
13.	ආචාර්ය කේ.ඒ. ලලිතධීර මහතා	අධ්‍යක්ෂ ජනරාල්, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
14.	ආචාර්ය එම්.පී. කුමාර මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
15.	එස්.යූ. ප්‍රියන්ත ජිනදාස මහතා	උසස් අධ්‍යයන අංශ ප්‍රධානී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
16.	ඉංජිනේරු සනත් පනවෙන්නගේ	පාලන මණ්ඩල සාමාජික,සහකාර අධ්‍යක්ෂ, නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
17.	අජිත් සෙනෙවිරත්න මහතා	පාලන මණ්ඩල සාමාජික,අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ නාවික ලේකම් කාර්යාලය
18.	ආරියසීල වික්‍රමනායක මහතා	පාලන මණ්ඩල සාමාජික
19.	ආරියසිරි විතානගේ මහතා	පාලන මණ්ඩල සාමාජික
20.	හෙක්ටර් හේමචන්ද්‍ර මහතා	පාලන මණ්ඩල සාමාජික
21.	සාලිය වික්‍රමසුරිය මහතා	පාලන මණ්ඩල සාමාජික
22.	හේමන්ත රත්නායක මහතා	ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය (ලේකම්)

02. ශාස්ත්‍රීය සභාව සහ සංයුතිය

01.	මහාචාර්ය ආර්.එම්. වසන්ත රත්නායක මහතා	උපකුලපති, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය (සභාපති)
02.	ආචාර්ය එම්.එෆ්.එම්. ෆයිරෝස් මහතා	පීඨාධිපති, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
03.	ආචාර්ය එච්.බී. ජයසිරි මහතා	පීඨාධිපති, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
04.	පී.යූ.අයි. පෙරේරා මහතා	අධ්‍යක්ෂ (පුහුණු), ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
05.	ආචාර්ය එම්.පී. කුමාර මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
06.	ආචාර්ය ජේ.කේ. රාජපක්ෂ මහතා	උසස් අධ්‍යයන අංශ ප්‍රධානී, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
07.	ආචාර්ය ඩබ්.ඒ.ඒ.ඩී. ලංකා වික්‍රමසිංහ මහත්මිය	උසස් අධ්‍යයන අංශ ප්‍රධානී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
08.	හේමන්ත රත්නායක මහතා (ලේකම්)	ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
09.	එච්.කේ.ආර්. තුෂාර මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
10.	ආචාර්ය චම්පා අමරසිරි මහත්මිය	උසස් අධ්‍යයන අංශ උපදේශිකා, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
11.	නිශාන්ති පෙරේරා මිය	උසස් අධ්‍යයන අංශ උපදේශිකා ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
12.	එස්.යූ. ප්‍රියන්ත ජිනදාස මහතා	උසස් අධ්‍යයන අංශ ප්‍රධානී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
13.	එන්. දුෂානි මහත්මිය	කථිකාචාර්ය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
14.	ශ්‍යාමලි රත්න ශ්‍රී මහත්මිය	උසස් අධ්‍යයන අංශ ප්‍රධානී, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
15.	නලින් ද අල්විස්	උසස් අධ්‍යයන අංශ ප්‍රධානී, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
16.	ඒ.එච්.එස්. වීරකෝන් මහතා	උසස් අධ්‍යයන අංශ ප්‍රධානී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
17.	නිසඟ නුවන්ත මහතා	කථිකාචාර්ය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

03. දළ විශ්ලේෂණය

03.1 ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ආරම්භය, විකාශය සහ අරමුණු



ශ්‍රී ලංකාවේ ධීවර, සාගර සහ සමුද්‍රීය ක්ෂේත්‍රවල මිනිස්බල අවශ්‍යතා සපුරාලීම සඳහා විද්‍යාත්මක, තාක්ෂණික සහ කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කර දැනුම ලබා දී රටේ සංවර්ධනය උදෙසා දායකත්වය දීමේ කාර්යභාරය 2014 අංක 31 දරන පනතින් ස්ථාපිත ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය විසින් ඉටු කරනු ලැබේ.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය දක්වා වූ ගමනේ මූලාරම්භය සටහන් වනුයේ මීගමුව ප්‍රදේශයෙනි. 1963 වර්ෂයේදී මීගමුව ධීවර පුහුණු ආයතනය වශයෙන්ද, 1972 වර්ෂයේදී තංගල්ල, මඩකලපුව, යාපනය ප්‍රදේශ වලින් ආරම්භ වී 1975 වර්ෂයේ මට්ටක්කුලියද, 1993 වර්ෂයේදී ත්‍රිකුණාමලය ද ලෙස ධීවර පුහුණු මධ්‍යස්ථාන 06 ක ක්‍රමික විකාශයකින් පසු 1999 වර්ෂයේදී ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතන පනත මඟින් 1999 දෙසැම්බර් මස 20 වැනි දින සිට ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය නමින් ස්ථාපිත වී 2006 වර්ෂයේදී ගාල්ල සහ 2008 වසරේදී කළුතර උතුර ප්‍රදේශයේ නව ධීවර හා නාවික ඉංජිනේරු විද්‍යාල 02 ක් ව්‍යාප්ත විය. මෙලෙස, ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ ආවරණය වන අයුරින් විහිදුන ප්‍රාදේශීය මධ්‍යස්ථාන 08 ක වෘත්තීය පුහුණු අංශය ක්‍රියාත්මක වන අතර පීඨ 02 කින් සමන්විත වූ උසස් අධ්‍යයන අංශය ද එකතුව ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ශ්‍රී ලාංකික ධීවර ක්ෂේත්‍රය, නාවික හා සාගරය පිළිබඳ පර්යේෂණ සඳහා අවශ්‍ය මානව සම්පත සපයන කාර්යභාරයේ නිරත වේ.

2001 වර්ෂයේදී උපාධි පාඨමාලා ප්‍රධානය කිරීම ආරම්භ වීමත් සමඟ 2003 වසරේදී ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී පාඨමාලාවද, නාවික ඉංජිනේරු විද්‍යාවේදී පාඨමාලාව සහ යාත්‍රා ගොඩනැඟීම් සහ නාවික නිර්මාණ ශිල්පී විද්‍යාවේදී පාඨමාලාවද රජයේ පිළිගත් උපාධි පාඨමාලා වශයෙන් ගැසට් කර ප්‍රකාශයට පත් කරන ලදී.

2014 වසරේදී නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධි පාඨමාලාව ද, 2015 වසරේදී වෙරළ සහ සාගර සම්පත් කළමනාකරණ විද්‍යාවේදී උපාධි පාඨමාලාව ද ආරම්භ කරන ලද්දේ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය තුල වාණිජ හා කලා ඇතුළු සියලු විෂය ධාරාවන්ගෙන් උසස් පෙළ සමත් වන සිසුන්ට උසස් අධ්‍යයන අවස්ථා ලබා දීම පුළුල් කිරීම සඳහා වේ.

1999 වසරේදී පිහිට වූ ධීවර හා නාවික ඉංජිනේරු ආයතන පනත අහෝසි කරමින් 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත සම්මත වූ අතර, 2015 වසරේදී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පූර්ණ විශ්වවිද්‍යාලයක් ලෙස ස්ථාපනය වීමෙන් දුදරුවන්ට උසස් අධ්‍යයන වරම් සඳහා වැඩි ඉඩකඩක් විවෘත වී ඇත.

03.2 ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ කාර්යභාරය හා සේවා දායකත්වය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය උසස් අධ්‍යයන අංශය සමන්විත වන පීඨ:

01. ධීවර හා සමුද්‍රීය විද්‍යා පීඨය - තංගල්ල
02. ඉංජිනේරු සහ කළමනාකරණ පීඨය -මට්ටක්කුලිය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සතු වෘත්තීය පුහුණු අංශය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය මධ්‍යස්ථාන 08:

01.	**තංගල්ල**	-	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, මහවෙල පාර, තංගල්ල
02.	**ගාල්ල**	-	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, 284/ඒ, ගාලු පාර , බූස්ස, ගාල්ල
03.	**පානදුර**	-	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය,දොඹගහවත්ත,උයන්කැලේපාර,පානදුර
04.	**මට්ටක්කුලිය**	-	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, කාකදූපත, මට්ටක්කුලිය, කොළඹ 15.
05.	**මීගමුව**	-	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය,වැල්ලවිදිය, මීගමුව.
06.	**මඩකලපුව**	-	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, නාවලඩි, මඩකලපුව
07.	**ත්‍රිකුණාමලය**	-	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, කොඩ්බේ,චීන වරාය,ත්‍රිකුණාමලය
08.	**යාපනය**	-	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, දෙවන හරස් විදිය,ගුරු නගර් ,යාපනය

සේවා දායකත්වය

ධීවර, සාගර සහ සමුද්‍රීය ක්ෂේත්‍රවල මානව සම්පත් සංවර්ධන කාර්යයන්හි දී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය මගින් පහත සඳහන් කණ්ඩායම් ආයතනයේ ඉලක්ක ගත කණ්ඩායම් ලෙස සලකා සේවා දායකත්වය සපයනු ලැබේ.

- ධීවර,සමුද්‍ර විද්‍යා සහ සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රයන්හි නියැලී සිටින්නන්
- ධීවර , සමුද්‍ර විද්‍යා සහ සමුද්‍රීය තාක්ෂණ ක්ෂේත්‍රයන්ට අලුතින් අවතීර්ණ වන්නන්
- ධීවර , සමුද්‍ර විද්‍යා සහ සමුද්‍රීය තාක්ෂණ ක්ෂේත්‍රයන්ට අවතීර්ණ වීමට අපේක්ෂා කරන්නන්
- ධීවර, සමුද්‍ර විද්‍යා සහ සමුද්‍රීය තාක්ෂණ විෂයයන් ඉගැන්වීම කරන ආචාර්ය මණ්ඩලය සහ උපදේශකවරුන්

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය යටතේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය මධ්‍යස්ථාන




04. උසස් අධ්‍යයන අංශය

සාගර විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යයන අංශය යටතේ 2021 වසර තුලදී උපාධි පාඨමාලා 06 ක්, ප්‍රථම වරට තාක්ෂණවේදී උපාධි පාඨමාලාවක සමාරම්භය ද ඇතුළත්ව ක්‍රියාත්මක විය. ධීවර හා සමුද්‍ර විද්‍යා පීඨය යටතට ධීවර හා සමුද්‍රීය විද්‍යා, සාගර විද්‍යා සහ ජලජීවී වගාව හා මුහුදු ආහාර පිළිබඳ තාක්ෂණවේදී උපාධි පාඨමාලා පැවැත්වූ අතර, ඉංජිනේරු හා නාවික කළමනාකරණ පීඨය යටතේ නාවික ඉංජිනේරු, නාවික ප්‍රවාහනය සහ සැපයුම් කළමණාකරණ, වෙරළ සහ නාවික සම්පත් කළමණාකරණ උපාධි පාඨමාලා ක්‍රියාත්මක විය. 2017 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලය විසින් පවත්වන උපාධි පාඨමාලාවන් ගාස්තු අයකිරීමෙන් නිදහස් කර ඇත. නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හා ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී උපාධි පාඨමාලා සඳහා Z අගය (Z-Score) මත පදනම්ව ද අනෙකුත් උපාධි පාඨමාලා සඳහා අභියෝගයතා පරීක්ෂණ ප්‍රතිඵල මත ද ශිෂ්‍ය බඳවා ගැනීම් වසර තුළදී සිදු කර ඇත.

වගුව අංක 1- වාර්ෂික ශිෂ්‍ය ලියාපදිංචිය

	විද්‍යාවේදී උපාධි වැඩසටහන්	**ශිෂ්‍ය සංඛ්‍යාව**									
		2012/2013	**2013/2014**	**2014/2015**	**2015/2016**	**2016/2017**	**2017/2018**	**2018/2019**	**2019/2020**	**2020/2021**	**2021/2022**
01	නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය	**12**	**42**	**27**	**26**	**35**	**40**	**37**	**47**	**50**	**46**
02.	නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධිය				**36**	**39**	**47**	**53**	**53**	**73**	**83**
03.	වෙරළ සහ නාවික සම්පත් කළමනාකරණ උපාධිය				**13**	**14**	**40**	**45**	**55**	**65**	**54**
04.	ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී උපාධිය	**27**	**27**	**12**	**43**	**40**	**41**	**41**	**49**	**59**	**68**
05.	සාගර විද්‍යා විද්‍යාවේදී උපාධිය								**26**	**23**	**23**
06.	ජලජීවී වගාව හා මුහුදු ආහාර පිළිබඳ තාක්ෂණවේදී උපාධිය									**40**	**76**



වගුව අංක 2 - උපාධිය හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව

	උපාධි පාඨමාලා	ශිෂ්‍ය සංඛ්‍යාව					
		2016/2017	**2017/2018**	**2018/2019**	**2019/2020**	**2020/2021**	**2021/2022**
1.	නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය	26	31	36	36	49	42
2.	නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධිය	34	42	52	53	71	82
3.	වෙරළ සහ නාවික සම්පත් කළමනාකරණ උපාධිය	12	36	42	50	61	51
4.	ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී උපාධිය	32	21	28	35	48	66
	ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී උපාධිය (විශේෂවේදී)	05	-	-	-	-	-
5.	සාගර විද්‍යා උපාධිය (විද්‍යාවේදී -අවු. 4)	-	-	-	20	22	18
6.	ජලජීවී වගාව හා මුහුදු ආහාර පිළිබඳ තාක්ෂණවේදී උපාධිය	-	-	-	-	40	74

සිසුන් ආයතනික පුහුණුව සඳහා යොමු කිරීම

උපාධි පාඨමාලාව හදාරණ සිසුන් පාඨමාලාව අවසානයේදී ආයතනික පුහුණුව සඳහා යොමු කරන අතර, එමගින් සිසුන් හට ක්ෂේත්‍රය හා සම්බන්ධ විවිධ ආයතනයන් සමග සම්බන්ධ වී කටයුතු කිරීමට හැකියාව ලැබේ.මෙම වසරේ සිසුන් 21 ක් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත ආයතනික පුහුණුව (Internship) සඳහා යොමු කර ඇත.

4.1 අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ගුණාත්මකභාවය

වගුව අංක 3 - ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ධීවර හා සාගර විද්‍යා පීඨයේ ආචාර්ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්		
01.	ආචාර්ය එම්. එෆ්. එම්. ෆයිරෝස් මහතා	B.Sc., (M. Phil, Ruhuna, Sri Lanka), D. Sc (Shizuoka, Japan)
02.	ආචාර්ය එම්. පී. කුමාර මහතා	B.Sc. (Hons), (Ruhuna, SL), Ph. D (Edinburgh Napier, UK)
03.	ආචාර්ය ඩබ්.ඒ.ඒ.ඩී.එල් වික්‍රමසිංහ මිය	B.Sc. (Hons) (Ruhuna, Sri Lanka), M.Sc. (Vrije, Belgium) Ph.D.(ICAR-CIFE, Mumbai,India)
04.	ආචාර්ය ජේ.කේ. රාජපක්ෂ මහතා	B.Sc. in Physical Science (Peradeniya, SL), M.Sc. (Gothenburg, Sweden), Ph.D. (Peradeniya, SL
05.	එස්. එන්. දුෂානි මිය	B.Sc. (Hons), (Ruhuna, SL), M.Sc. (UiT, Norway), Ph. D scholar (UiT, Norway)
06.	එස්.පී.යූ. ජිනදාස මහතා	B.Sc. in Special in Geology (Peradeniya, SL), (Mphil) Applied Geophysics (Open University Sri Lanka)
කථිකාචාර්යවරුන්		
01.	ආචාර්ය එන්. පී. ජී. පුෂ්පිත මහතා	B.Sc. (Hons), (Ruhuna, SL),,Mphil (Ruhuna, SL), M.Sc. (Korea Maritime and Ocean University, Korea, Ph.D. (Ruhuna, SL)
02.	බී.ඒ. එන්. ඉන්දිකා මිය	B.Sc. (Hons), (Ruhuna, SL), M.Sc. (Pukyong National University, Korea) M.Sc. in Fisheries and Aquactic Resources Management (Jayawardhanapura, SL)
03.	ඩබ්. ඒ. ඒ. යූ. කුමාර මහතා	B.Sc. (Hons), (Ruhuna, SL), M.Sc. (James Cook, Australia)
04.	එම්. අයි. යූ. මානික්කආරච්චි මිය	B.Sc. (Hons) (Ruhuna, SL), M.Sc.(World Maritime University, Sweden)
05.	ටී.ඩබ්.එස්. වර්ණසූරිය මහතා	**B**.Sc. (Hons), (Ruhuna, SL)), M.Sc. (Colombo, SL)
06.	ඒම්.අයි.ජී. රත්නසූරිය මහතා	B.Sc. (Hons), (Ruhuna, SL), M. Sc (Pukyong National University, Korea)
07.	ඩබ්.ඒ. ශිරාන් චාමික මහතා	B. Sc (Hons), (Ocean University, SL), M.Sc. (Pukyong National University, Korea)

වගුව අංක 4 -ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ නාවික ඉංජිනේරු හා කළමනාකරණ පීඨයේ ආචාර්‍ය්‍ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්		
01.	ආචාර්ය එච්.බී.ජයසිරි මහතා	B.Sc. in Biological Science (Ruhuna, SL), M.Sc. (Gothenburg, Sweden), Ph.D. (CIFE, Mumbai, India)
කථිකාචාර්යවරුන්		
01.	එම්.සී.එල් .සොයිසා මිය	B.Sc. in Fisheries Science (National Institute of Fisheries & Nautical Engineering, SL), M.Sc. in Aquaculture and Fisheries Management at Kelaniya, SL)
02.	ඊ.ඒ.කේ.කේ. අමරසේකර මිය	B.Sc. in Fisheries Science (National Institute of Fisheries & Nautical Engineering, SL), M.Sc. in Aquaculture and Fisheries Management at Kelaniya, SL)
03.	එච්.ඒ.පී.එස්.ජයපාල මහත්මිය	B.Sc. in Degree (Open SL), M.Sc. in Fisheries & Aquatic Resources Management (Sri Jayawardhanapura, SL)
04.	පී.ඒ.එස්.ඒ. රත්නශ්‍රී මිය	B.Sc. (Special) in Aquatic Science (Sri Jayawardhanapura, SL), M.Sc. in Environmental Science (Open University, SL)
05.	ඒ. අරුල්නායගම් මිය	B.Sc. (Special) in Environmental Sciences, Vauniya Campus of the (University of Jaffna, SL), M.Sc. in Environmental Science (Peradeniya, SL)
06.	ඩී.එස්.මානගේ මිය	B.Sc. (Hons) in Transport & Logistics Management (Moratuwa, SL), MBA in Business Administration
07.	එච්. ඩී.එම්.එම්.පුස්සැල්ල මිය	B.Sc. (Hons) in Business Administration (Peradeniya, SL)
08.	ටී.පී.ජී.එන්.අසන්ත ද අල්විස් මහතා	B.Sc. (Hons) in Transport & Logistics Management (Moratuwa, SL), MBA in Management & Finance
09.	එම්.ජේ.එම්.ඒ. රසුල් මහතා	B.Sc. in (Ruhuna, SL), MSc. (Agder, Norway), M.Sc. Master of Engineering in Marine System Engineering. Major: Marine Electrical and Electronics (Korean Maritime Ocean University)
10.	ඒ.එච්.එස්.අයි. වීරකෝන් මහතා	B.Sc. in Ocean University of Sri Lanka, M.Sc. Master of Science in Mechanical Engineering. Major: Ocean Energy and Fluid Dynamics (Korean Maritime Ocean University)
11.	ජී.ඒ.එස්. චතුරි ගනේපොල මිය	Master of Business Administration, University of Colombo, Bachelor of Business Administration (Hons) in Business Economics, University of Colombo Passed Finalist in Charted Institute of Management Accountants (CIMA)
12.	ඩබ්.පී.ඩබ්.අන්ජලිකා මිය	B.A. in Economics (Special) Degree University of Sabaragamuwa
13.	ඒච්.ඒ.ඩී. නිසඟ නුවන්ත මහතා	B.Sc. in Marine Engineering, Ocean University of Sri Lanka
14.	සඳුන් කෞශල්‍ය විමලරත්න මහතා	B.Sc. in Marine Engineering, Ocean University of Sri Lanka

4.2 අධ්‍යයන/අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදු කළ පර්යේෂණ හා ප්‍රකාශන 2021

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන/අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් යොමු ගත සුවිගත වාර සඟරා ලිපි සහ යොමු ගත සුචි ගත නොකළ වාර සඟරා ලිපි ප්‍රකාශයට පත් කර ඇත. කාර්ය මණ්ඩලයේ සියලුම ප්‍රකාශ පිළිබඳ සාරාංශයක් වගුවේ දක්වා ඇත.

වගුව : අධ්‍යයන කාර්ය මණ්ඩලය සිදු කළ පළ කිරීම් - 2021

පීඨය		ප්‍රකාශන කාණ්ඩය		සංඛ්‍යාව	
				දේශීය	විදේශීය
ධීවර හා සමුද්‍රීය විද්‍යා පීඨය	1	විද්‍යුත් වාර සඟරා ඇතුළු සුවිගත යොමු ගත වාර සඟරා වල පළකිරීම් සංඛ්‍යාව			19
	2	විද්‍යුත් වාර සඟරා ඇතුළු සුවිගත නොකළ යොමු ගත වාර සඟරා වල පළකිරීම් සංඛ්‍යාව			
	3	සම්මන්ත්‍රණ කාර්ය සටහන්	3.1 සම්පූර්ණ ලිපි වල පළ කළ ලිපි සංඛ්‍යාව		02
			3.2 සාරාංශ පළ කිරීම් සංඛ්‍යාව		12
	4	පළ කළ ග්‍රන්ථ පරිච්ඡේද			
	5	විශේෂඥ ක්ෂේත්‍රවල පළ කළ ග්‍රන්ථ/පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	5.1 ප්‍රකාශකයෙක් මඟින්		
			5.2 කතෘවරයෙක් මඟින්		01
ඉංජිනේරු සහ කළමනාකරණ පීඨය	1	විද්‍යුත් වාර සඟරා ඇතුළු සුවිගත යොමු ගත වාර සඟරා වල පළකිරීම් සංඛ්‍යාව		01	07
	2	විද්‍යුත් වාර සඟරා ඇතුළු සුවිගත නොකළ යොමු ගත වාර සඟරා වල පළකිරීම් සංඛ්‍යාව			01
	3	සම්මන්ත්‍රණ කාර්ය සටහන්	3.1 සම්පූර්ණ ලිපි වල පළ කළ ලිපි සංඛ්‍යාව		03
			3.2 සාරාංශ පළ කිරීම් සංඛ්‍යාව	06	18
	4	පළ කළ ග්‍රන්ථ පරිච්ඡේද			01
	5	විශේෂඥ ක්ෂේත්‍රවල පළ කළ ග්‍රන්ථ/පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	5.1 ප්‍රකාශකයෙක් මඟින්		
			5.2 කතෘවරයෙක් මඟින්		

වගුව : අනධ්‍යයන කාර්ය මණ්ඩලය සිදු කළ පළ කිරීම් - 2021

විධායක කාර්ය මණ්ඩලය		ප්‍රකාශන කාණ්ඩය		සංඛ්‍යාව	
				දේශීය	විදේශීය
	3	සම්මන්ත්‍රණ කාර්ය සටහන්	3.1 සම්පූර්ණ ලිපි වල පළ කළ ලිපි සංඛ්‍යාව		
			3.2 සාරාංශ පළ කිරීම් සංඛ්‍යාව	02	

4.3 <u>ප්‍රගතිය</u>

- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රකාශන ප්‍රථම වෙළුම 01 සඳහා පර්යේෂණ පත්‍රිකා සාරාංශ කැඳවීම.

- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ තෙවන පර්යේෂණ සමුළුව 2021.11.17 දින පැවැත්වීම.

- 2021 වර්ෂයේ ජුලි මස සිට අධ්‍යාපනික ණය යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ ලංකා බැංකුව මඟින් ශිෂ්‍යයින් වෙත ලබා දීම.
- අනෙකුත් රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබන විශ්වවිද්‍යාලයීය සිසුන් හට හිමි අනුග්‍රාහක දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ සිසුන් හටද ලබා ගැනීම සඳහා කටයුතු සැළසීම.
- මහජන බැංකු අධ්‍යාපනික ණය යෝජනා ක්‍රමය යටතේ ශිෂ්‍යයින් සඳහා ලැප්ටොප් පරිගණක මිළදී ගැනීමට අවස්ථාව සළසා දීම.
- 2021 ජුනි 07 දින ලෝක සාගර දිනය සැමරීම සඳහා ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය විසින් මාර්ගගත ක්‍රමය ඔස්සේ දේශන සංවිධානය සිදු කිරීම.

- විෂය කේන්ද්‍රීය සම්මන්ත්‍රණ මාලාව ඇරඹීම හා 2021 වසර තුළ සම්මන්ත්‍රණ 06 ක් පැවැත්වීම.
- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය (Learning Management System) යාවත්කාලීන කිරීම.
- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යයන අංශ ශිෂ්‍ය පරිසර සංගමය මඟින් ජාත්‍යන්තර කඩොලාන සංරක්ෂණ දිනය වෙනුවෙන් මාර්ගගත ක්‍රමය මඟින් දේශණ සංවිධානය කිරීම.
- හදිසි ගිනිගැනීමේ තත්ත්වයට භාජනය වූ එක්ස්පර්ල් පර්ල් නෞකාවේ ආපදා තත්ත්වය පිළිබඳ අධ්‍යයන සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල දායකත්වය ලබා දීම.

- 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා උපාධි පාඨමාලා 06 ක් සඳහා 2020 උසස් පෙළ සමත් සිසුන්ගේ අයදුම්පත් කැඳවීම් සහ අයදුම්පත් 11000 ක් අතරින්, ඉන් 330 ක් සඳහා උපාධි පාඨමාලා හැදෑරීමට අවස්ථා සළසා දීම.
- IESL සම්මතයන්ට අනුකූල වන සේ නාවික ඉංජිනේරු උපාධි පාඨමාලා විෂය නිර්දේශ සංශෝධනය කිරීම.
- නාවික ඉංජිනේරු උපාධි පාඨමාලා සඳහා ISO තත්ත්ව සහතික ලබාගැනීම.
- සමුද්‍රීය ඉංජිනේරු විද්‍යා හා තාක්ෂණ පිළිබඳ වෘත්තීය සාමාජිකත්ව ආයතනයේ (IMarEST) සාමාජිකත්වය යාවත්කාලීන කිරීම.
- වරලත් ලොජිස්ටිකස් සහ ප්‍රවාහන ආයතනයේ සීඅයිඑල්ටී - (Charted Institute of Logistics and Transportation Membership) වෘත්තීය සාමාජිකත්වය අළුත් කිරීම.
- සේවයේ නියුතු නිලධාරීන් සඳහා උපාධි පාඨමාලා හැදෑරීමේ අවස්ථාව ලබාදීමේ කටයුතු සම්පාදනය කිරීම. මේ සඳහා පාලන මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, ඇතුළත් කිරීම් ප්‍රතීතන සහ තත්ත්ව සහතික කිරීමේ සභාවේ අනුමැති ලබා ගැනීමට නියමිතව ඇත.

- උපාධි පාඨමාලා සඳහා අඛණ්ඩ මුදා හැරීමේ සහතිකය (CDC) ලබා ගැනීම වෙනුවෙන් ශාස්ත්‍රීය සභාවේ අනුමැතිය ලැබී ඇති අතර,වෙළඳ හා නාවික අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමට නියමිතය.

- ආදී ශිෂ්‍යයින් සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය සමඟ සම්බන්ධීකරණ වැඩසටහනක් ස්ථාපිත කිරීමට කටයුතු කිරීම.

- සමුද්‍ර විද්‍යා ධාරිතාව වැඩි කිරීම සඳහා ඉන්දියානු සාගර විද්‍යාත්මක ආයතන සමඟ සහයෝගී ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම.

ජාත්‍යන්තර සහයෝගීතාවයන්

01. කොරියාවේ ජාතික කොරියා නාවික හා විශ්වවිද්‍යාලය (National Korea Maritime & Ocean University) සහ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය අතර, අධ්‍යාපනික සහයෝගිතා ගිවිසුමට එළඹීම හා ඒ අනුව, පහත සඳහන් සහයෝගීතා ක්‍රියාකාරකම් සිදු කිරීමට අවස්ථාව හිමිකර ගැනිම.

(අ) අධ්‍යයන, පර්යේෂණ හා පරිපාලන යන කාර්යමණ්ඩල හුවමාරුව

(ආ) ශිෂ්‍ය හුවමාරුව

(ඇ) සාමුහික පර්යේෂණ, දේශණ සහ සම්මන්ත්‍රණ පිළිබඳ අධ්‍යාපනික සහයෝගීතාවය

(ඈ) අනෝන්‍ය කැමැත්ත අනුව අධ්‍යයන තොරතුරු ද්‍රව්‍ය හුවමාරුව

02. ව්‍යාපෘති වාර්තා සංවර්ධනය පිළිබඳ මහා බ්‍රිතාන්‍යයේ ප්ලිමත් **(Plymoth)** විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුම් ගතවීම විදේශ කටයුතු අමාත්‍යාංශය සහ නීතීපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට ක්‍රියාකිරීම.


03. ශ්‍රී ලංකා ඇමෙරිකා ලොස් ඇන්ජලීස් ජායාරූප සංගමය මඟින් සමුද්‍රීය පරිසර ආශ්වාය තේමාව යටතේ ශ්‍රී ලංකා වෙරළ හා සාගර පරිසරය පිළිබඳ වර්තමාන තත්ත්වය මාර්ගගත දේශන ක්‍රමයට (On line) ලබා දීම.


04. ගෝලීය කොරල්පර ජාලය සඳහා කොරල්පර පිළිබඳ දකුණු ආසියානු දත්ත විශ්ලේෂණ වැඩමුළුව සඳහා සම්පත් දායකත්වය මාලදිවයිනට ලබා දීම.

5. වෘත්තීය පුහුණු අංශය

2021 වර්ෂය තුලදී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ වෘත්තීය පුහුණු අංශ ප්‍රාදේශීය විද්‍යාල (08) පාඨමාලා ප්‍රගතිය

ක්ෂේත්‍රය	නිපුණතා මට්ටම් NVQ/ NON NVQ)	ශිෂ්‍ය සංඛ්‍යාව
ධීවර හා ජලජීවී වගාව	NVQ	377
	Non	304
තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන	NVQ	44
	Non	0
සමුද්‍රීය හා නාවික විද්‍යාව	NVQ	180
	Non	83
වෙනත් (ජංගම)	NVQ	0
	Non	383






	මීගමුව	යාපනය	මට්ටක්කුලිය	ගාල්ල	නීකුණාමලය	මඩකලපුව	පානදුර	තංගල්ල
ඩිප්ලෝමා	92	10	153	46	0	0	107	80
සහතික පත්‍ර	129	69	152	106	36	58	22	136
ජංගම පුහුණු	0	0	74	46	0	0	0	0
එකතුව	221	79	379	198	36	58	129	216

5.1 2021 වර්ෂයේදී ලබාගත් ජයග්‍රහණයන් පහත පරිදි වේ.

❖ බුස්ස ප්‍රදේශයේ ගාලු- කොළඹ ප්‍රධාන පාරට මුහුණලා පිහිටි ආර්ථික මධ්‍යස්ථාන ගොඩනැගිලි පුහුණු ආයතනයකට උචිතවන පරිදි නවීකරණය කර ගාල්ල ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයේ පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කරන ලදි.





❖ පාඨමාලා අවසානයේ ප්‍රාදේශිය විද්‍යාල මඟින් රැකියාගත පුහුණු ආයතන සඳහා සිසුන් අනුයුක්ත කිරීම.

❖ NVQ 5 මට්ටමේ සිට NVQ 6 සහ NVQ 7 යන මට්ටම් දක්වා පාඨමාලා සංවර්ධනය කිරීම.

❖ මධ්‍යස්ථාන සඳහා තත්ත්ව කළමනාකරණ පද්ධති (Quali ty Manage ment System -QMS) හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම තුල විධිමත් කළමනාකරනයකින් යුතු ඵලදායී සේවාවක් අභ්‍යාසලාභීන්ට ලබා දීමට ක්‍රියා කිරීම.

❖ 2021 ජූලි මස ජාතික නිපුණතා දිනය වෙනුවෙන් ශ්‍රී ලංකා සාගර විද්‍යාලයේ වෘත්තීය පුහුණු අංශය මඟින් ජලජීවී වගාව හා ජලජ සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළව සජීවී වාර්තාමය වැඩසටහනක් පුද්ගල සහභාගීත්වය 256 ක් සඳහා සාර්ථකව පවත්වන ලදී.

❖ පානදුර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ජලජීවී වගාව ජලජ සම්පත් කළමනාකරණ පිළිබඳ ජාතික ඩිප්ලෝමාව NVQ 5 පාඨමාලාව හදාරන සිසුන් 40 දෙනෙකු සඳහා වරලත් ලොජිස්ටිකස් සහ ප්‍රවාහන සාමාජිකත්ව ආයතනයේ (Charted Institute of Logistics and Transportation Membership) වෘත්තීය සාමාජිකත්වය ලබා ගැනීමට ක්‍රියා කිරීම.

❖ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ වෘත්තීය පුහුණු අංශයේ NVQ 5 පාඨමාලා හදාරන සිසුන් උසස් අධ්‍යයන අංශයේ තාක්ෂණවේදී උපාධිය (B.Tec) හැදෑරීමට අවස්ථාව සළසා දීම.

❖ රේඛීය අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේ ජූලි මස දී විශ්වවිද්‍යාලයීය ආධුනික සිසු/සිසුවියන් සඳහා ආරක්ෂිත ඇඳුම් කට්ටල (Overall Kit) 1627 ක් ලබා දීම හා එම කට්ටල බෙදා දීම.

❖ දිවයින පුරා සිටින බහුදින ධීවර යාත්‍රා නියමුවන් 427ක් සඳහා ධීවර යාත්‍රා නියමු පුහුණුව ලබා දීම.

5.2 <u>ශිෂ්‍ය සහභාගීත්වය වැඩි දියුණු කිරීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග</u>

❖ ධීවර ප්‍රජාව පාඨමාලා පිළිබඳ දැනුවත් කර ඔවුන්ගේ දරුවන්ට පාඨමාලා හැදෑරීමට අවකාශ සලසා දීම.

❖ දිවයින පුරා විසිර සිටින සේවා අපේක්ෂිතයින් දැනුවත් කිරීම සඳහා පුවත්පත්,රූපවාහිනී සහ විද්‍යුත් මාධ්‍යයන් ඔස්සේ පාඨමාලා පිළිබඳ විස්තරාත්මක තොරතුරු පල කිරීම මඟින් පාඨමාලා සඳහා ශිෂ්‍යයන් බඳවා ගැනීමේ වර්ධනයක් ඇති කිරීමට ක්‍රියා කිරීම.

❖ ප්‍රාදේශීය මධ්‍යස්ථාන විසින් තම බල ප්‍රදේශයන්ට අයත් රාජ්‍ය පාසල් වල සිසුන්, ගුරුභවතුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

❖ දේශීය සහ ජාතික මට්ටමේ ප්‍රදර්ශන වෙනුවෙන් ප්‍රදර්ශන කුටි ඉදිරිපත් කිරීම මඟින් ජනතාව දැනුවත් කිරීම.

කෝවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය ශ්‍රී ලංකාවටද කරන ලද බලපෑම හේතුවෙන් ආරම්භ කරන ලද පාඨමාලා සඳහා බඳවා ගත් සිසුන්ගේ අධ්‍යයන කටයුතු අවසන් කිරීමට නොහැකි වූ අතර සමස්ත වාර්ෂික පුහුණු ඉලක්ක සපුරා ගැනීමට ද නොහැකි විය.

6. පාලන අංශය

පාලන අංශ උප ඒකක ප්‍රගතිය පහත දැක්වේ.

6.1 මානව සම්පත් අංශය

මෙම ආයතනයේ මානව සම්පත් සංවර්ධන අංශය ආයතනයේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේ හා ඵලදායි කාර්යශූර කාර්ය මණ්ඩලයක් බිහි කිරීමේ අරමුණින්, මානව සම්පත් බඳවා ගැනීම හා සංවර්ධනය සිදු කරයි. සේවක සුබසාධනය ප්‍රමුඛ කොට සලකන අතර,විනය ගරුක කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කාර්ය පද්ධති කළමනාකරණය සිදු කරයි.

<u>ප්‍රගතිය</u>

1. අතිගරු ජනාධිපතිතුමා විසින් 2021.01.12 දින සිට බලපැවැත්වෙන පරිදි විශ්වවිද්‍යාලය සඳහා කුලපතිවරයෙකු පත් කිරීම.
2. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පැවති උපකුලපති තනතුර සඳහා නව උපකුලපතිවරයකු බඳවා ගැනීම.
3. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය අන්තර්ග්‍රහණය කිරීමේදී සිදුව ඇති විෂමතා අභියාචනා මණ්ඩලයට යොමු කොට දුක්ගැනවිලි සම්බන්ධයෙන් නිසි පියවර ගෙන වැටුප් සකස් කර එම වැටුප ගෙවීමට කටයුතු කිරීම.
4. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරී කාණ්ඩවලට අවශ්‍ය බඳවා ගැනීම සඳහා බඳවා ගැනීම් පටිපාටිය සකස් කර, අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සහ කළමනාකරණ සහකාර සහ ඊට පහළ කාර්ය මණ්ඩල ශ්‍රේණීන් සඳහා බඳවා ගැනීම් පරිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම.
5. UPL සහ UMN සේවා කාණ්ඩවලට අයත් රියදුරු හා සමාන්තර ශ්‍රේණිවල සහ කළමනාකරණ සහකාර හා සමාන්තර ශ්‍රේණිවල වසර ගණනාවක් තිස්සේ ප්‍රමාදව පැවැති කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා ඔවුන්ගේ ශ්‍රේණි උසස්වීම් ලබා දීම.
6. UPL සහ UMN සේවා කාණ්ඩවලට අයත් රියදුරු හා සමාන්තර ශ්‍රේණිවල සහ කළමනාකරණ සහකාර හා සමාන්තර ශ්‍රේණිවල වසර ගණනාවක් තිස්සේ ප්‍රමාදව පැවැති අභ්‍යන්තර උසස්වීම් ලබා දීම.
7. වසර ගණනාවක් ප්‍රමාදව පැවැති අධ්‍යන කාර්ය මණ්ඩලයේ අභ්‍යන්තර උසස්වීම් ලබා දීම.
8. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියලු සාමාජිකයන් ඉගැන්වීම පිළිබඳව පුහුණු පාඨමාලාවට (මාස 06ක) යොමු කොට පුහුණු කටයුතු අවසන් කර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.
9. අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව (Cadre) 2016 වර්ෂයේ දී අනුමත කර ඇති අතර එය වර්තමාන අවශ්‍යතාවට අනුව වැඩි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා 2022 වර්ෂයේ දී ඒ සඳහා අනුමැතිය ලැබීමට නියමිත වීම.
10. නාවික ඉංජිනේරු උපාධි පාඨමාලාවට හා Engine Rating and Deck Rating ඩිප්ලෝමා පාඨමාලා සඳහා ISO 9001 තත්ව සහතික ලබා ගැනීමට හැකි ආකාරයට මානව සම්පත් සංවර්ධන අංශයේ පරිපාලන හා ලිපිගොණු කටයුතු විධිමත් කිරීම.
11. අධ්‍යයන අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා අවශ්‍ය පුහුණු කටයුතු යටතේ සේවකයන් 03 දෙනෙකු සඳහා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා සඳහා යොමු කිරීම.

2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා කාර්ය මණ්ඩලය පහත පරිදි දැක්විය හැකිය.

සේවක		2021.01.01- 2021.12.31		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව
ජ්‍යෙෂ්ඨ මට්ටම				
	නිත්‍ය (පරිවාස කාලයට යටත් නිලධාරීන් ඇතුළුව)	19	14	33
	කොන්ත්‍රාත් පදනම	01	02	03
	අනියම්	0	0	0
	*එකතුව **(1)***	**20**	**16**	**36**
තෘතීය මට්ටම				
	නිත්‍ය (පරිවාස කාලයට යටත් නිලධාරීන් ඇතුළුව)	03	01	04
	දරන්නාට පෞද්ගලික වනසේ	*14	03	17
	අනියම්	0	0	0
	*එකතුව **(2)***	**17**	**04**	**21**
ද්විතීය මට්ටම				
	නිත්‍ය (පරිවාස කාලයට යටත් නිලධාරීන් ඇතුළුව)	31	33	64
	දරන්නාට පෞද්ගලික වනසේ	**03	00	03
	කොන්ත්‍රාත් පදනම	24	10	34
	*එකතුව **(3)***	**58**	**43**	**101**
ප්‍රාථමික මට්ටම				
	නිත්‍ය (පරිවාස කාලයට යටත් නිලධාරීන් ඇතුළුව)	56	08	64
	දරන්නාට පෞද්ගලික වනසේ	***08	0	08
	*එකතුව **(4)***	64	08	72
සේවක එකතුව (1)+(2)+(3)+(4)		**159**	**71**	**230**

* ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සඳහා මෙම තනතුරු තෘතීක මට්ටමේ තනතුරු ලෙස අනුමත කර තිබිණි. එසේවුවද, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පිහිටුවීමට පෙර පැවති ජාතික ධිවර හා නාවික ඉංජිනේරු ආයතනයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරුවල කාර්ය මණ්ඩල සමාජිකයින් 17 දෙනෙකු ඔවුන් සිටි සේවා මට්ටම දරන්නාට පුද්ගලික වනසේ, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය එම ජ්‍යෙෂ්ඨ සේවා මට්ටම තුල අන්තර්ග්‍රහනය කර ඇත.

** ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සඳහා මෙම තනතුරු ද්විතීක මට්ටමේ තනතුරු ලෙස අනුමත කර තිබිණි. එසේවුවද, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පිහිටුවීමට පෙර පැවති ජාතික ධිවර හා නාවික ඉංජිනේරු ආයතනයේ තෘතීක මට්ටමේ අනුමත කාර්ය මණ්ඩල සමාජිකයින් 03 දෙනෙකු ඔවුන් සිටි සේවා මට්ටම වූ තෘතීක මට්ටම සඳහා දරන්නාට පුද්ගලික වනසේ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය එම තෘතීක සේවා මට්ටම තුල අන්තර්ග්‍රහනය කරඇත.

*** ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සඳහා මෙම තනතුරු ප්‍රාථමික මට්ටමේ තනතුරු ලෙස අනුමත කර තිබිණි. එසේවුවද, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පිහිටුවීමට පෙර පැවති ජාතික ධිවර හා නාවික ඉංජිනේරු ආයතනයේ ද්විතික මට්ටමේ අනුමත කාර්ය මණ්ඩල සමාජිකයින් 08 දෙනෙකු ඔවුන් සිටි සේවා මට්ටම වූ ද්විතීක මට්ටම සඳහා දරන්නාට පුද්ගලික වනසේ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ එම ද්විතික සේවා මට්ටම තුල අන්තර්ග්‍රහණය කර ඇත.

6.2 ප්‍රවාහන අංශය

ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය වෙත ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලබාදෙන ලද වාහන 06 හී අඩුපාඩු සකස්කර ධාවන තත්වයට ගෙන විශ්වවිද්‍යාලයේ රාජකාරී කටයුතු වල යෙදවීම සහ ජනාධිපති ලේකම් කාර්යාලය සතුව පැවැති වාහන හිමිකාරිත්වය ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය සඳහා පවරා ගැනීමට කටයුතු කිරීම.

මෝටර් රථ වර්ගය	වාහන අංකය
ටෝයෝටා ලෑන්කෘෂර් ජීප් රථය	65-5278
ටෝයෝටා කරීනා කාර් රථය	KB 7104
නිසාන් සනී කාර් රථය	KO 8661
මහේන්ද්‍රා බොලැරෝ කැබ්	PA 7094
ටාටා මිනී බස් රථය	NA 9673
සුසුකි ලියානා කාර් රථය	KA 9810

6.3 <u>තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට සහ උපායමාර්ගයට අනුකූල වීම.</u>

01. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය 2017 අංක 19 දරණ ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනතෙහි 14 වන වගන්තිය ප්‍රකාරව තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට සහ උපායමාර්ගයට අනුකූලව විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යයන, පුහුණු සහ පරිපාලනමය ක්‍රියාමාර්ග සැළසුම් කර ඇත.

02. නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ විෂය පථයට අදාළව වෙන් කර හඳුනාගෙන්නා ලද කාර්යයන් සහ ඉලක්කයන් එම ඉලක්ක කරා ළඟා විය යුතු දර්ශකයන්, සංධිස්ථානයන් සහ ඉලක්ක වෙත ළඟා වීම මැන බැලීම සඳහා වන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයට අදාළ දර්ශකයන් ඉදිරිපත් කර ඇත.


03. ඒ අනුව, රේඛීය අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාලයට අදාළව හඳුන්වා දී ඇති තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හා දර්ශකයන්ට අදාළව ක්‍රියාත්මකකරන ලද ව්‍යාපෘති/ වැඩසටහන්වලට අදාළ ප්‍රගතිය නියාමනය කරනු ලබයි.

07. අභ්‍යන්තර විගණන අංශය

2021 වර්ෂයේ ප්‍රගතිය.

- ❖ අභ්‍යන්තර විගණන වැඩ සැලැස්ම තුළ ක්‍රියාත්මක වීම.
- ❖ අභ්‍යන්තර විගණන විමසුම් 08 ක් සම්පාදනය කිරීම හා එහි ප්‍රගති කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ❖ විගණන කළමනාකරණ කමිටු 03 පවත්වා ආයතනය විසින් ගනු ලබන ක්‍රියාමාර්ගයන් සමාලෝචනය කිරීම.

අභ්‍යන්තර විගණන විමසුම්



08. අවසන් ගිණුම්

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන	31/12 /2021 දිනට		31/12/2020 දිනට	
		රු.		රු.	
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපළ, පිරියත හා උපකරණ	(1)	623,672,536		681,792,712	
අස්පෘශ්‍ය වත්කම්		4,361,400.00	628,033,936	1,058,500.00	682,851,212
ස්ථාවර තැන්පතු		11,658,355		5,065,976	
ජංගම වත්කම්			11,658,355		5,065,976
කාර්යමණ්ඩල ණය	(2)	12,627,161		15,195,354	
භාණ්ඩ ලේඛනය 31.12.2021 දිනට අවසන් තොගය	(3)	570,731		1,747,782	
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ	(4)	34,261,785		60,926,113	
අවිනිශ්චිත ගිණුම්		85,433		85,433	
මුදල්හා මුදල් සමාන දේ	(5)	30,877,801	78,422,910	15,579,135	93,533,817
මුළු වත්කම්			718,115,201		781,451,005
ගිණුම් සහ වගකීම්					
ප්‍රාග්ධන සංචිත	(6)	11,658,355		5,584,122	
සමුච්චිත අරමුදල	(7)	788,025,807		802,744,130	
සමුච්චිත අරමුදල SSDP	(8)	280,954,073		300,060,865	
රජයේ ප්‍රදාන AHEAD ව්‍යාපෘතිය		1,628,640		-	
වෙනත් ප්‍රදාන	(9)	14,234,250		-	
සමුච්චිත අතිරික්තය/ (හිඟය)	(10)	(528,338,308)		(518,985,846)	
	(11)		568,162,817		589,403,271
ජංගම නොවන වගකීම්					
විලම්බිත ආදායම්					
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්		79,028,671	79,028,671	69,939,906	69,939,906
උපචිත වියදම් (උපලේඛණ 01)		50,356,737		101,359,285	
ගෙවිය යුතු දේ	(12)	20,566,974	70,923,711	20,748,541	122,107,826.0
මුළු වගකීම්			**718,115,201**		**781,451,005**

M. K. KAHAWITA
DIRECTOR FINANCE
Ocean University Of Sri Lanka
Crow Island, Mattakkuliya,
Colombo 15.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

	සටහන	2021	2020
		රු.	රු.
මෙහෙයුම් ආදායම			
රජයේ ප්‍රදාන		375,333,000	377,767,500
වෙනත් ආදායම්	**(13)**	28,159,493	11,503,957
SSDP- පුනරාවර්තන ප්‍රදාන		1,187,393	6,365,418
රජයේ ප්‍රදාන පුනරුත්ථාපන හා වෙනත්		2,884,115	-
මෙහෙයුම් ආදායම		**407,564,001**	**395,636,875**
විලම්භිත ආදායම ක්‍රමක්ෂය ගැලපීම		89,532,996	66,254,496
		497,096,997	**461,891,371**
මෙහෙයුම් වියදම්			
පුද්ගල පඩිනඩි	**(14)**	314,556,362	329,477,470
ගමන් වියදම්	**(15)**	1,145,084	2,053,428
සැපයුම් සහ පරිභෝජන වියදම්	**(16)**	6,441,602	5,249,848
නඩත්තු වියදම්	**(17)**	9,154,615	4,823,133
ගිවිසුම්ගත සේවාවන්	**(18)**	61,409,962	44,299,344
පුහුණු වියදම්	**(19)**	10,190,629	11,269,887
වාර්ෂික ක්ෂය	**(9)**	89,109,596	66,162,157
ක්‍රමක්ෂය වියදම්	**(9)**	423,400	92,340
වෙනත් වියදම්	**(20)**	5,239,525	2,527,638
මුළු වියදම		497,670,776	465,955,244
ශුද්ධ අතිරික්තය / ඌණතාවය		**(573,779)**	**(4,063,873)**

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
2021/12/31දිනෙන් අවසන් වර්ෂය සඳහා
හිමිකම වෙනස් වීමේ ප්‍රකාශය

	රු.						
	රජයේ දායකත්වය	වෙනත් ප්‍රදාන	SSDP ප්‍රදාන	ප්‍රාග්ධන සංචිත	AHED Grant	සමුච්චිත අතිරික්තය (හිඟය)	එකතුව
2020/01/01 දිනට ශේෂය	**(6,584,250)**	**6,584,250**	**239,045,854**	**3,576,819**		**(514,449,817)**	**271,827,144)**
වාර්ෂික ලාභය						(4,063,873)	(4,063,873)
සේවක ප්‍රතිලාභ මත තත්‍ය (අලාභය) / ලැබීම්						-	-
පෙර වර්ෂය සඳහා ගැළපීම්							-
ප්‍රාග්ධන හා සංචිත				2,007,302		(472,156)	1,535,146
වාර්ෂික ප්‍රාග්ධන ප්‍රදාන	42,000,000		65,962,050				107,962,050
විලම්භිත ආදායම	(61,307,457)		(4,947,039)				(66,254,496)
2020.12.31 දිනට ශේෂය	**796,159,879**	**6,584,250**	**300,060,865**	**5,584,121**	**-**	**(518,985,846)**	**(232,648,317)**
සේවක ප්‍රතිලාභ මත තත්‍ය (අලාභය) / ලැබීම්						(573,779)	(573,779)
පෙර වර්ෂය සඳහා ගැළපීම්	**7,113,931**					(2,704,449)	4,409,482
ප්‍රාග්ධන හා සංචිත				6,074,234		(6,074,234)	-
වාර්ෂික ප්‍රාග්ධන ප්‍රදාන	**53,582,468**	**15,300,000**	**(2,229,266)**		1,628,640		68,281,842
විලම්භිත ආදායම	(68,830,470)	(7,650,000)	(16,877,526)				(93,357,996)
2021/12/31 දිනට ශේෂය	**788,025,807**	**14,234,250**	**280,954,073**	**11,658,355**	**1,628,640**	**(528,338,308)**	**568,162,818**

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
මුදල් ප්‍රවාහ ප්‍රකාශය (වක්‍ර ක්‍රමය)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

	31/12/2021	31/12/2020
	රු .	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
බදු කරණයට පෙර ශුද්ධ ලාභය /අලාභය	(573,779)	(4,063,873)
මුල්‍ය නොවන ගැලපීම්		
ස්ථාවර තැන්පතු පොලී	(390,660)	(458,278)
පාරිතෝෂික වෙන්කිරීම්	11,475,194	8,455,039
ක්ෂයකිරීම්	89,532,996	66,254,497
පෙර වර්ෂය ගැලපීම්	4,409,482	(33,269)
වාහන - ප්‍රදාන	15,300,000	-
ක්‍රමක්ෂය කිරීම්	(89,532,996)	(66,254,497)
කාරක ප්‍රාග්ධනය ගැලපීමට පෙර මෙහෙයුම් ලාභය	**30,220,237**	**3,899,619**
(වැඩිවීම්)/ අඩුවීම් කාර්ය මණ්ඩල ණය	2,568,193	(2,027,844)
(වැඩිවීම්)/ අඩුවීම් තොග	1,177,051	(325,559)
(වැඩිවීම්/ අඩුවීම් වෙළඳාම සහ අනෙකුත් ලැබිය යුතු දෑ	26,813,068	(28,285,719)
(වැඩිවීම්/ අඩුවීම වෙළඳාම සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	(64,205,307)	18,862,220
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය කළ මුදල්	(3,426,758)	(11,776,902)
පාරිතෝෂික ගෙවීම්	(2,386,430)	(1,894,302)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	(5,813,188)	(1,894,302)
ආයෝජන ක්‍රියාකාරම්වලින් මුදල් ප්‍රවාහය		
ස්ථාවර තැන්පතු පොළි ලැබීම්	241,920	472,157
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම	(25,519,529)	(99,735,501)
ස්ථාවර තැන්පතු මත ආයෝජනය	(6,592,379)	(472,157)
ආයෝජන ක්‍රියාකාරම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	(31,869,988)	(99,735,501)
මුල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
ස්ථාවර තැන්පතු /සංචිත	6,074,234	2,007,303
ප්‍රාග්ධන ප්‍රදාන	53,582,468	42,000,000
ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන සඳහා ප්‍රාග්ධන ප්‍රදාන	(2,229,266)	65,962,050
AHEAD ව්‍යාපෘතිය මඟින් ප්‍රදාන	1,628,640	-
සංචිතයට අරමුදල් මාරුකිරීම	(6,074,234)	(472,157)
මුල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිතවූ ශුද්ධ මුදල් ප්‍රවාහය	52,981,842	109,497,196
මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම /(අඩුවීම)	15,298,666	(9,890)
කාලපරිච්ඡේදයේ ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	15,579,135	15,589,028
කාලසීමාව අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ	**30,877,801**	**15,579,138**

සටහන - 01 (ඒ) දේපළ පිරියත හා උපකරණ

විස්තරය	01.01.2021 දිනට පිරිවැය	වර්ෂය තුළ අත්පත් කර ගැනීම් (අපහරණය)	වාර්ෂික ක්ෂය වෙන්කිරීම් 2021	31.12.2021 දින සමුච්චිත ක්ෂය	31.12.2021 දිනට ශේෂය
ඉඩම් සහ ඉඩම් සංවර්ධනය	7,939,174.75		793,917.48	5,314,029.80	2,625,144.95
ගොඩනැගිලි පුනරුත්ථාපනය	134,743,703.51	14,420,480.72	6,914,822.48	86,798,619.67	62,365,564.56
යටිතල පහසුකම් -මීගමුව ඇටිය	379,687.57	-		379,686.57	1.00
අත්පත් කර ගැනීම් - යන්ත්‍ර සහ උපකරණ	143,872,231.72	4,231,720.40	14,539,056.89	101,573,523.19	46,530,428.93
අත්පත් කර ගැනීම්-ගොඩනැගිලි	212,145,729.00	(33,125,100.85)	8,587,110.98	55,652,254.73	123,368,373.42
පුනරුත්ථාපනය/ බෝට්ටු හා යාත්‍රා	14,000,253.33	-	1,400,025.33	13,304,326.53	695,926.80
ධීවර ආම්පන්න උපකරණ	37,273,126.17	-	-	37,273,125.17	1.00
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	117,901,145.00	(8,054,872.18)	10,984,627.30	62,989,850.41	46,856,422.41
නාම පුවරු	1,459,114.80	-	145,911.48	1,246,987.31	212,127.49
පුස්තකාල පොත්	26,191,593.78	3,644,010.31	2,801,359.89	19,473,166.52	10,362,437.57
වෙනත් වත්කම්	616,000.00	1,542,531.03	94,324.86	667,969.35	1,490,561.68
පුනරුත්ථාපනය - වාහන	24,815,448.00	684,162.96	1,395,882.97	24,788,446.96	711,164.00
පරිගණක	47,886,561.33	629,988.00	14,298,742.96	48,025,158.69	491,390.64
අත්පත් කරගැනීම් - වාහන	57,673,703.02	-	3,825,000.00	50,023,702.02	7,650,001.00
විද්‍යාගාර උපකරණ	9,728,427.82	-		9,728,426.81	1.01
පුනරුත්ථාපනය - කාර්යාල උපකරණ	3,128,138.00	(16,749.63)	311,138.84	1,840,688.59	1,270,699.78
පුනරුත්ථාපනය - යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	3,502,639.00	(228,760.30)	327,387.87	2,833,083.74	440,794.96
අත්පත් කරගැනීම්- පුහුණු උපකරණ	77,536,114.94	668,635.05	7,669,825.62	42,394,705.46	35,810,044.53
පුනරුත්ථාපනය - පුහුණු උපකරණ	8,849,670.43	-	884,967.04	5,625,915.46	3,223,754.97
මීගමුව නේවාසිකාගාරය	37,436,137.51	-	1,871,806.88	12,166,744.72	25,269,392.79
සභාපති කාර්යාල ගොඩනැඟිල්ල	20,185,385.00	-	1,009,269.25	6,055,615.50	14,129,769.50
යාපනය ගොඩනැඟිල්ල	27,646,398.62	-	1,382,319.93	9,100,272.87	18,546,125.75
විශ්වවිද්‍යාල ලෝගු	1,079,250.00	-	215,850.00	754,799.99	324,450.01
වෙබ්අඩවි සංවර්ධනය - අස්පෘශ්‍ය වත්කම්	1,058,500.00	-	423,400.00	515,740.00	542,760.00
වැඩහල මට්ටක්කුලිය	6,680,948.90	-	334,047.45	668,103.34	6,012,845.56
පානදුර ගොඩනැඟිල්ල	163,495,807.31	-	8,174,790.36	8,174,790.37	155,321,016.94
බුස්ස ගොඩනැඟිල්ල	22,948,208.05	-	1,147,410.40	1,147,410.40	21,800,797.65
මෘදුකාංග සංවර්ධනය	3,818,640.00	-			3,818,640.00
එකතුව (ඒ)	**1,213,991,738**	**(15,603,954.49)**	**89,532,996.26**	**608,517,144.17**	**589,870,638.90**

සටහන- 01 (බී)කෙරීගෙන යන වැඩ

